## පොල්පිතිගම ප්‍රාදේශීය සභාව

## කුරුණෑගල දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 30 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ). සමාලෝචිත වර්ෂයේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ත, මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල මුදල් ශේෂය දැක්වීමේදී කොන්ක්‍රීට් ව්‍යාපෘතියට අදාලව සාරාංශ මුදල් පොත (ප්‍රා.ස.10) අනුව පැවති රු.711,385 ක ශේෂය නොගෙන ලෙජරයේ මුදල් ගිණුම අනුව වූ රු.716,535 ක ශේෂය ගෙන තිබුණි. එමෙන්ම ඊට අදාලව බැංකු සැසඳුම පිළියෙල කිරීමේදී ද ප්‍රා.ස. 10 අනුව මුදල් ශේෂය නොගෙන ලෙජර් ගිණුම අනුව ශේෂය ගෙන තිබුණි.

(ඇ). සභාවේ පවතින වැඩසටහන් 6 න් වැඩසටහන් 5 කට සමාලෝචිත වර්ෂයට අදාලව ලැබී තිබූ රු.15,036,390 ක වැටුප් ප්‍රතිපූරණ ආදායම් හා වියදම් ගිණුමේ වැඩසටහන් 1 යටතේ පමණක් (1/71) දක්වා තිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂයට අදාලව කොන්ක්‍රීට් ව්‍යාපෘති ගිණුමෙහි ලාභය වූ රු.67,826 ක ප්‍රමාණය ආදායම් හා වියදම් ගිණුමට හෝ සමුච්චිත අරමුදලට ගලපා නොතිබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂය තුළදී මිලදීගෙන තිබූ රු.188,377 ක් වටිනා ස්ථාවර වත්කම්, ස්ථාවර වත්කම් යටතේ ශේෂ පත්‍රයට ගෙන නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 5 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.20,624,168 ක් වූ අතර, උපයෝගී ලේඛන / වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.16,739,438 ක් විය.

1.3.3 පැහැදිලි නොකළ වෙනස්කම්

ගිණුම් විෂයයන් 2 කට අදාලව පැහැදිලි නොකල රු. 1,687,150 ක ශේෂයක් පැවතුණි.

1.3.4 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතුව ගිණුම් ශේෂවල වටිනාකම රු.69,691,794 ක් විය.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) <u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම</u>

ගිණුම් විෂයයන් 4 ක් යටතේ පැවති රු.5,378,782 ක්'වටිනාකමැති ස්ථාවර වත්කම් සඳහා වූ උපලේඛණ හා ස්ථාවර වත්කම් ලේඛණ ඉදිරිපත් නොවීම හේතුවෙන් විගණනයේදී එකී විෂයයන් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ආ) පිළිතුරු නොලත් විගණන විමසුම්

2011 මැයි 30 දින වන විට විගණන විමසුම් 02 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළ හැකි ගණුදෙනුවල වටිනාකම රු3,343,625 ක් විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු5,303,185 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු510,328 ක් විය.

2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන ඌණතා /අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ). පොදු ගිණුමෙහි හා කර්මාන්ත ගිණුමෙහි බැංකු සැසඳුමට අදාල අවස්ථා 18 ක් යටතේ පැවති රු.1,445,364 ක ගැලපුම්, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිරවුල් කර නොතිබුණි.

(ආ). කල් ඉකුත් තැන්පතු, මුදල් රෙගුලාසි 571(2) පරිදි කටයුතු කර නියාදනය කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානයට ද එසේ කටයුතු නොකරන ලද අවස්ථා 12 ක් යටතේ රු.357,774 ක තැන්පත් ශේෂයක් පැවතුනි.

(ඇ). ණය හිමියන් රු.68,058,969 න් රු.65,338,631 ක් අවුරුදු 1ට වැඩි කාලයක සිට පැවත එන ණය හිමියන් වූ අතර, වසර 1කට වැඩි කාලයක සිට පැවත එන කලින් ලද ආදායම් යටතේ පෙන්වා ඇති රු.38,400 ක ශේෂයක් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම නිරවුල් කර නොතිබුණි.

(ඈ). ලැබිය යුතු ගිණුම් යටතේ වෙනත් ආදායම් වශයෙන් දක්වා තිබූ උසාවි දඩ රු.718,425 ක් ද ස්ථාවර තැන්පත් පොලී රු.1,133,432 ක් ද අවුරුදු 3 ට වැඩි කාලයක සිට පැවත එන නමුත් ඒවා සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් කර නොතිබුණි.

(ඉ). බැංකු ගිණුම් 02 ක ට අදාලව නිකුත් කල නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ රු. 50,733 ක් වටිනා චෙක්පත් 16 ක් පැවතුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇසතමේන්තුගත | 2009 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 10 | 10 | - | 10 | 09 | 01 |
| (ii) | බදුකුලී | 2,991 | 2,945 | 46 | 1,619 | 1,533 | 86 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 700 | 700 | - | 652 | 732 | - |
| | එකතුව | 3,701 | 3,655 | 46 | 2,281 | 2,274 | 87 |

2.3.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් 2007 දෙසැම්බර් 31 දක්වා අයකල රු718,425 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි. 2008 වර්ෂයේ සිට ලැබිය යුතු උසාවි දඩ මුදල් ගණනය කර ගිණුම් ගතකර නොතිබුණි.

2.3.3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අයවිය යුතු මුදල ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

2.3.4 කඩ කාමර බදු

පොදු වෙළඳපල අංක 03 කඩ කාමරයේ 2007 වර්ෂයට අදාලව රු.15,000 ක හිඟ ශේෂයක් පැවති අතර 2008 හා 2009 මාර්තු දක්වා මෙකී කඩ කාමරය බදු දීමටද නොහැකි වී තිබුණි.

2.4 වියදම් ව්‍යුහය

---------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 21,370 | 16,418 | 4,952 | 18,107 | 15,655 | 2,452 |
| අනෙකුත් | 9,069 | 9,738 | (669) | 8,282 | 7,033 | 1,249 |
| උප එකතුව | 30,439 | 26,156 | 4,283 | 26,389 | 22,688 | 3,701 |
| ප්‍රාග්ධන වියදම | 18,550 | 62,520 | (43,970) | 72,050 | 260,265 | (188,215) |
| මුළු එකතුව | 48,989 | 88,676 | (39,687) | 98,439 | 282,953 | (184,514) |

2.5 මානව සම්පත් කළමණාකරණය

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 01 | - |
| ද්විතීයික | 27 | 22 |
| ප්‍රාථමික | 38 | 37 |
| වෙනත් (අනියම්, තාවකාලික) | - | 08 |

2.6 වත්කම් කළමණාකරණය

2.6.1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.70,938,087 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.2,833,189 ක් විය.

2.6.2 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.44,696 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.40,696 ක් විය.

2.7 හඳුනාගත් පාඩු

සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි කලට නොගෙවීම හේතුවෙන් රු.8,600 ක ප්‍රමාද දඩ මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී සභා අරමුදලින් ගෙවීමට සිදුව තිබුණි.

2.8 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයින්ට අදාලව සභාව විසින් එකී අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු. 1,695,509 ක් ව තිබුණි. එමෙන්ම සභාවට අදාල මාසික වාරිකය ලෙස රු. 5,698 බැගින් එකී අරමුදල විසින් අය කර පැවතියද, එකී අය කිරීම් සභාවේ කුමන සේවකයන්ට අදාලවද යන්න සභාව දැණුවත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලව සභාව විසින් පිළියෙල කර තිබූ අයවැය ලේඛණය අනුව සුසාන භූමි 117 ක් පිළිබඳ විස්තර පැවතියද මින් අක්කර 40 ක පමණ වපසරයකින් යුත් සුසාන භූමි 35 ක් ආරවුල්ව පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය. මෙකී සුසාන භූමි සම්බන්ධයෙන් 1988 මූල්‍ය හා පරිපාලන රීති ප්‍රකාරව වාර්ෂික සමීක්ෂණයක් ද සිදුකර නොතිබුණි.

(ඇ). සභා භූමියේ පැවති තේක්ක හා බුරුත ගස් 2 ක් ඉරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල රු.38,958 ක මුදලක් ගෙවා තිබුණි. මෙකී ගස් කැපීමට ප්‍රථම අදාල බලධාරීන්ගෙන් අවසර ලබා ගැනීමක් හෝ අදාල ගස් ඉරීමට ප්‍රථම ඒවායෙන් ලබාගත හැකි දැව ප්‍රමාණයන් පිළිබඳ ඇස්තමේන්තු කිරීමක් සිදුව නොතිබූ අතර, ඉරුම් කුලී වාර්තා අනුව ලෑලි දික් අඩි 605.3 ක් ද විවිධ ප්‍රමාණයේ බාල්ක ල දික් අඩි 1262.9 ක් ද පැවති බව අනාවරණය විය. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම මෙකී ලී ප්‍රමාණයන් තොග පොත් වලට ගෙන නොතිබුණි.

2.9 කාර්ය සාධනය

-----------------

අයවැය පාලනය

--------------------

සමාලෝචිත වර්ෂයට අදාල අයවැය ලේඛණය අනුව ආදායම් ශීර්ෂ 6 ක් යටතේ රු.1,334,000 ක ආදායමක් ඇස්තමේන්තු කර පැවතියද ඒ යටතේ කිසිදු ආදායමක් ලැබී නොතිබුණි.

2.10 අභ්‍යන්තර විගණනය

------------------------

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

03. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) ආදායම් පාලනය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) වත්කම් කළමනාකරණය